1st Place Winner
National Productivity
Award 2020

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

SLSI SYSTEM CERTIFIED ISO 9001

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/06/ANN.TR/2025(85) | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.09. 11 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් සහ සියලු ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු - 2025

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද දකුණු පළාත් ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2025 හා 2025.02.05 දිනැති චක්‍රලේඛය හා බැඳේ.

02. වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව සිය ආයතනයෙන් නිදහස් කළ යුතු නිලධාරීන් නියමිත දිනට නිදහස් නොකොට තව දුරටත් රඳවා ගැනීමට ඇතැම් ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කරන බවට තොරතුරු මා වෙත වාර්තා වී ඇත.

03. ඒ අනුව, වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් නිකුත් කරන ලද උක්ත චක්‍රලේඛයේ 7.22, 16, 17, 18 හා 20 ඡේද කෙරෙහි ඔබගේ කාරුණික අවධානය නැවතත් යොමු කරවමි.

04. එකී ඡේදයන් මඟින් පෙන්වා දී ඇති ආකාරයට වාර්ෂික ස්ථාන මාරු නියමිත දිනට ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳ ඔබට අවධාරණය කරන අතර, නියමිත දිනයේදී තම ආයතනයේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොකිරීම මත ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලිකව වගකිව යුතු බව ද, එලෙස කටයුතු නොකරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට පියවර ගන්නා බවද මෙයින් ඔබ වෙත කාරුණික දන්වා සිටිමි.

05. තව ද, වාර්ෂික ස්ථාන මාරු නියෝග පිළිබඳ දැනුම් දෙන ලද මාගේ අංක CSS/03/06/ANN. TR/2025(72) හා 2025.08.02 දිනැති ලිපිය, අභියාචනා තීරණ නිකුත් කරන ලද මාගේ අංක CSS/03/06/04/ANN.TR/2025(79) හා 2025.08.26 දිනැති ලිපිය මඟින් ද ඉහත කාරණය නැවත නැවතත් අවධාරණය කර ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

රනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

පිටපත් :

01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය, ගාල්ල - දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව- අදාළ වාර්ෂික ස්ථාන මාරු නියමිත දිනට ක්‍රියාත්මක වීම පිළිබඳ ව පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத் தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"